පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 09 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- පෙරදිග සංගීතය

පාසලේ නම : ........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2

## පෙරදිග සංගීතය I

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) සියලුම ස්වර ශුද්ධ ව යෙදෙන රාග යුගලය වන්නේ,

(1) බිලාවල්, කාෆි (2) බිලාවල්, භූපාලි (3) කාෆි, භූපාලි (4) කාෆි, යමන්

(02) ''පකඩ්'' යනුවෙන් හඳුන්වන්නේ රාගයක,

(1) වාදී ස්වරය යි.
(2) සර්ගම් ගීතය යි.
(3) මුඛ්‍යාංගය යි.
(4) ආරෝහණ හා අවරෝහණය යි.

(03) නිර්දේශිත රාග අතරින් මධ්‍යමය හා නිෂාදය වර්ජිත ව යෙදෙන රාගය වන්නේ,

(1) බිලාවල් (2) භූපාලි (3) කාෆි (4) යමන්

(04) රාගයක අවම වශයෙන් තිබිය යුතු ස්වර ගණන,

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

(05) හින්දුස්ථානී සංගීතයේ රාග, ථාට යටතේ වර්ග කරන ලද්දේ,

(1) භාත්ඛණ්ඩේ පඬිතුමා
(2) රවීන්ද්‍රනාත් තාගෝර් තුමා
(3) අමීර් කුෂ්රු පඬිතුමා
(4) ජයදේව පඬිතුමා

(06) |ග - ම|ප - ග |ම - ග |රි - -| යන ස්වර පාදය මධ්‍යම භාවයෙන් ලියූ විට ලැබෙන නිවැරදි ස්වර පාදය වන්නේ,

(1) ධ - නි | ස් - ධ | නි - ධ |ප --
(2) නි - සං | රිං - නි |සං - නි |ධ --
(3) ධ - නි |ස් - ධ| නි - ධ| ප ---
(4) ධ - නි |සං - රි| ගං - ම| පං ---

(07) ''තෙදිනි විරාජ'' ගීතයෙහි තනු නිර්මාණය සඳහා ආභාසය කරගත් නාද මාලාව වන්නේ,

(1) නෙළුම් ගී තනු
(2) රාගාශ්‍රිත තනු
(3) ප්‍රශස්ති ගී තනු
(4) දරු නැළවිලි ගී තනු

(08) ''දැතට වළලු'' ගීතය නිර්මාණය කරන ලද්දේ,

(1) සී. ද එස්.කුලතිලක මහතා.
(2) ඩබ්.බී.මකුලොලුව මහතා.
(3) ලයනල් රංවල මහතා.
(4) රෝහණ බැද්දගේ මහතා.

(09) බාහිරින් පැමිණෙන හඬ ග්‍රහණය කරගන්නා තාක්ෂණික මෙවලම වන්නේ,

(1) මයික්‍රෆෝනය (2) බෆල් (3) ඇම්ප්ලිෆයරය (4) මික්සර්

(10) “I have a dream” ගීතය ගායනා කරන සංගීත කණ්ඩායම වන්නේ,

(1) ත්‍රී සිස්ටර්ස්
(2) ජිප්සීස්
(3) මී මැස්සෝ
(4) ABBA

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන් උපයෝගී කරගන්න.**

| | | | | |
|---|---|---|---|---|
|  |  |  |  |  |
| A | B | C | D | E |

(11) උකුසා වන්නම සඳහා බෙර පදය වැයිය යුතු භාණ්ඩය වන්නේ,

(1) A (2) B (3) C (4) D

(12) හේවිසි වාදනය සඳහා යොදා ගන්නා භාණ්ඩ යුගලය වන්නේ,

(1) A, B (2) C, D (3) D, E (4) C, E

(13) D භාණ්ඩයෙන් වැයිය හැකි බෙර පදයක් වන්නේ,

(1) දොම් / කිත/ කිත/ දොම් (3) දොංජි/ ජිගත

(2) ජෙංකිට / තක්කිට (4) ගුංද/දෙගත/ගතිග/තගුඳ

(14) පංචතූර්ය වර්ගීකරණයේ විතත හා විතතාතත ගණයට අයත් භාණ්ඩ පිළිවෙළින් දැක් වූ විට,

(1) A, B (2) B, C (3) C, D (4) B, A

(15) එක් අතකින් වරපට තද කරමින් හා ලිහිල් කරමින් වාදනය කරන භාණ්ඩය වන්නේ,

(1) B (2) C (3) D (4) E

- **අංක 16 සිට 20 තෙක් දී ඇති වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✕) ලකුණ ද යොදන්න.**

(16) ''රැක් අත්තන මල මුදුනේ'' ගීතය උකුසා වන්නමේ නාද මාලාව ඇසුරින් නිර්මිත සරල ගීයකි. ( )

(17) නූර්ති ගීත සඳහා කර්ණාටක සංගීත ආභාසය ලබා ඇත. ( )

(18) # මෙම සලකුණ Sharp (ෂාර්ප්) ලෙස හඳුන්වයි. ( )

(19) ''හනික වරෙව් කොල්ලනේ'' ගීතය බෙරහඬ නාට්‍යයට අයත් වේ. ( )

(20) ඵාට ගායනා කළ හැකි අතර එයින් රසයක් ජනනය වේ. ( )

(20 ✕2 = ල.40)

.

## II කොටස

- **තෝරාගත් ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) A. රිනි, ධනි, පධ, මප

B. ගප, මග, මරිස

C. ගප, ධස, රිගරිස, ධපග

(i) ඉහත A, B, C යටතේ දැක්වෙන ස්වර ඛණ්ඩ අයත්වන රාග නම් කරන්න. (ල.3)

(ii) A හෝ B රාග අතරින් එක් රාගයක මේලය, ජාතිය, වාදි, සංවාදී ස්වර ලියන්න. (ල.4)

(iii) C රාගයේ ආරෝහණ හා අවරෝහණ ස්වර ලියන්න. (ල.2)

(iv) ඉහත A, B, C රාග අතරින් එක් රාගයක මධ්‍යලය ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.3)

(02) (i) මාත්‍රා 2, 3 මිශ්‍ර ව යෙදෙන හින්දුස්ථානී තාල පදය නම් කර තාල සංඥා, මාත්‍රා, රේඛාව සහිත ව ප්‍රස්තාර කරන්න. (ල.4)

(ii) ධා, ධිං, තා, තිං යන අක්ෂර හතර උපයෝගී කරගෙන ගොඩ නැගෙන හින්දුස්ථානී තාලය නම් කර ප්‍රස්තාර කරන්න. (ල.4)

(iii) දීප්චන්දි තාලයට සමාන බටහිර රිද්ම රටාව (Time signature) නම් කර එම තාලයට ගැළපෙන රිද්ම රටා තුනක් නිර්මාණය කරන්න. (ල.4)

(03) (a) ආරණ්නේ ඉන්නා මේ

(b) ඈත කඳුකර හිමව් අරණේ

(c) කුමට ද සොබනියෙ කඳුළු සලන්නේ

(d) වාසනා දිනේකි මේක

(e) ඇදුරු තුමා වන්න මගේ

(f) දැක්කොත් පද්මාවතී

(i) ඉහත දක්වා ඇති ගී පාදයන් නූර්ති හා නව නාට්‍ය වශයෙන් වර්ග කර ලියන්න. (ල.6)

(ii) දොහොරාවක් සහිත ව ගැයෙන නූර්ති ගීතයේ එම දොහොරා කොටස ලියන්න. (ල.2)

(iii) ඉහත දක්වා ඇති ගීතවලින් ඔබ කැමති ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න. (ල.4)

(04) (i) පහතින් දී ඇති ප්‍රකාශ අයත්වන සේ ගී වර්ගය (වන්නම්, ප්‍රශස්ති, හටන් ගී) හිස්තැන් ඉදිරියෙන් ලියන්න. (ල.6)

(a) ද්‍රවිඩ, තෙළිඟු, මලයාලි, සිංහල භාෂා මිශ්‍රණයක් දක්නට ලැබේ. ...........................................

(b) උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් තුනට ම අයත් වේ. ...........................................

(c) රජුන්ගේ, ප්‍රභූන්ගේ ගුණ ගායනා කරයි. ...........................................

(d) කොන්ස්තන්තීනු හටන, පරංගි හටන, මහ හටන ආදී කාව්‍ය ග්‍රන්ථ ඇත. ...........................................

(e) දෙවියන්, සතුන්, සිද්ධි හා වෙනත් වස්තූන් පිළිබඳ වර්ණනා ඇතුළත් වේ. ...........................................

(f) රජුගේ රණ ශූරත්වය, ජයග්‍රහණයන්, සතුරන්ට අත් වූ ඉරණම ආදිය ගැන වර්ණනාත්මක ව ගයයි. ...........................................

(ii) ඉහත සේ ගී වර්ග තුනෙන් එකකට අයත් ගීතයක් ලියන්න. (ල.6)

(05) |සසග- |රිරිම- |ගගප- |මධප- |

(i) ඉහත ස්වර පාදය බටහිර ක්‍රමයට රේඛා මණ්ඩලය මත ප්‍රස්තාර කරන්න. (ල.4)

(ii) ඉහත ස්වර පාදය පංචම භාවයට හරවා ලියන්න. (ල.4)

(iii) පහත මාතෘකාවලින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(a) sharp

(b) Flat


(c) Natural mark

(d) Celf

(e) Rest mark (2 × 2 = ල.4)

(06) ගැළපෙන පද වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i)




(ගිටාරය, Brass wind, single reed, වයලීනය, Double reed, තන්ත්‍රීය, සුෂිර, බෙස්ඩ්‍රම්) (ල.8)

(ii) ඔබ කැමති බටහිර සංගීත භාණ්ඩයක් ඇඳ එහි කොටස් තුනක් නම් කරන්න. (ල.4)

(07) පහත සඳහන් මාතෘකාවලින් 3 ක් තෝරාගෙන එකකට කරුණු 4 ක් වත් අඩංගු වන සේ කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය.

(ii) සංගීත ප්‍රසංගයක දී භාවිත කරන තාක්ෂණික මෙවලම්.

(iii) පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය.

(iv) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ.

(v) ජන ගී තනු ආශ්‍රිත ව නිර්මාණය වූ සරල ගී

(3 × 4 = ල.12)